සන්නස
SANNASA

# ජය ශ්‍රී මහා බෝධි අංකුරය රෝපණය කිරීමේ මහා පුණ්‍යෝත්සවය









## පසුබිම සහ හැඳින්වීම

මෙල්බර්න් නගරයේ සිට කි. මී. 150 පමණ උතුරට වන්නට පිහිටි බෙන්ඩිගෝ නගරය, ඕස්ට්‍රේලියාවේ සුදු ජාතික සංක්‍රමණිකයන් මුලින්ම ජනාවාසයක් ඇති කරගත් නගර වලින් එකක් වේ. නගරය තුළ අදටත් හමුවන අතහැර දමන ලද රත්‍රන් ආකරයන් ඊට තවමත් සාක්ෂි සපයයි. ලක්ෂ එකහමාරක පමණ ජනගහනයක් වෙසෙන මෙම නගරය, පසුගිය දශකය තුළ විශාල ලෙස අනෙකුත් රටවලින් සංක්‍රමණය වූ නොයෙක් ජාතීන්ගේ නිවහන බවට පත් වී ඇති අතර ඒ තුළ ශ්‍රී ලාංකික පවුල් පනහක පමණ ප්‍රමාණයක් ද පසුගිය වසර ගණනක් පුරා මෙහි වාසය කරයි. ගණනින් අතළොස්සක් වුවද, එම පිරිස තම සංස්කෘතික හා ආගමික අනන්‍යතාවය පවත්වාගනිමින්, බෙන්ඩිගෝ හි අනෙකුත් සංක්‍රමණික ජාතීන් අතරින් ඉදිරියෙන්ම සිටී. දරුවන් සඳහා සිංහල සහ නැටුම් පන්තියක් මෙන්ම වාර්ෂිකව පවත්වන අවුරුදු උත්සවය සහ ලාංකික ආහාර අලෙවි සැල බෙන්ඩිගෝ හි ඉතා ප්‍රසිද්ධියක් උසුලයි. ගෙවුනු කාලය පුරාම අපේම වූ ලාංකික අනන්‍යතාවකින් යුත් පන්සලක් නොමැති වීමේ අඩුව තදින්ම අප වෙත දැනී තිබුන අතර, එම අඩුව යම්තාක් දුරට පිරිමසනු ලැබුවේ බෙන්ඩිගෝ හි ස්ථාපනය කර ඇති, අක්කර පන්සියයක පමණ වර්ග ප්‍රමාණයකින් යුත්, බටහිර ලෝකයේ ඇති විශාලම ස්ථූපය සහිත තිබ්බත සම්ප්‍රදායේ (Tibetian) බෞද්ධ පූජා භූමියයි ( *Great Stupa of Universal Compassion* ). අවුරුදු ගණනක් පුරා අප විසින් පවත්වා ගෙන ගිය යහපත් සම්බන්ධතාවය නිසාවෙන්ම, අපගේම පන්සල් භූමියක් තනා ගැනීම සඳහා අවශ්‍ය ඉඩකඩ තිබ්බත පන්සලේ සභාපතිත්වය දරන ඕස්ට්‍රේලියානු ජාතික ඉයන් ග්‍රීන් මහතා විසින් අප වෙත පරිත්‍යාග කරන ලදි.

මූලික කටයුතු සහ ජයග්‍රහණයන් පුණ්‍ය භූමිය තැනීමේ මූලික කටයුතු දැනටමත් ආරම්භ කර ඇති අතර, අපේ අරමුණ සාක්ෂාත් වීමේ පෙර මග ලකුණු පෙන්වමින් මාස ගණනක් පුරා දරන ලද උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධි අංකුරයක්, ප්‍රථම වරට වික්ටෝරියා ප්‍රාන්තයට වැඩමවීමේ භාග්‍ය අප වෙත ලැබුණි. පසුගිය දෙසැම්බර් මස දහනමවන දින ජය ශ්‍රී මහා බෝධිය අභියස, ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා මහා කොමසාරිස්තුමා ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් ඉදිරියේ පිළිගන්වන්නට යෙදුනු බෝධි අංකුරය මේ වන විට මෙල්බර්න් හි නිරෝධායන මධ්‍යස්ථානයේ සුරක්ෂිතව පවතී.

ඉදිරි කටයුතු මෙම වසරේ අප්‍රේල් මස හතර වන දින, සවස දෙකට යෙදෙන සුභ මොහොතින්, අටමස්ථානාධිපති අති පූජ්‍ය ආචාර්ය පල්ලේගම සිරිනිවාස නායක හිමිපාණන් ඇතුළු අති සම්භාවනීය ගිහි පැවිදි අමුත්තන් රැසක් ඉදිරියේ, ශ්‍රී මහා බෝධි අංකුරය රෝපණය වනවා ඇත. මේ මහා දුර්ලභ පිංකමට සහභාගී වන ලෙස ගෞරවයෙන් ඔබ සහ පවුලේ සැමට ආරාධනා කරන්නෙමු.

අනාගතයේ දිනෙක මෙම ජය ශ්‍රී මහා බෝධි අංකුරය ලාංකික බෞද්ධයන්ගේ පමණක් නොව ලොව නන් දෙසින් මෙම ස්ථානයට පැමිණෙන, ලොව පුරා විසිරී සිටින සිය බෞද්ධයන්ගේ ගෞරවාදරයට පාත්‍ර වනු ඇත.

අතළොස්සක් පමණක් වූ අප පිරිස ඉදිරියේ ඇති දුෂ්කරම කාර්යය වන්නේ, මේ ඓතිහාසික පුණ්‍ය භූමිය ගොඩ නැගීම සඳහා අවශ්‍ය අරමුදල් සොයා ගැනීමයි.
ගෘහ නිර්මාණ ශිල්පීන් විසින් ඉදිරිපත් කරන ලද ආකෘතිය සහ ඒ සඳහා දැරිය යුතු බර පැන මේ සමග අමුණා ඇති අතර, ජීවිතේ එක් වරක් පමණක් ලැබෙන්නාවූ අති දුර්ලභ පුණ්‍ය කර්මයට ඔබට හැකි අයුරින් දායක වන ලෙස බැති සිතින් යුතුව ඉල්ලා සිටිමු













